සැ. යු. - 2022.03.11 දින පළ වූ අංක 2271 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,272 - 2022 මාර්තු මස 18 වැනි සිකුරාදා - 2022.03.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 492 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 524 |


*සැ. යු.*- (i) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2022 මාර්තු මස 11 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 අප්‍රේල් මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මාර්තු මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www. documents.gov.*lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


489 - B 82325 — 5,403 (2022/03)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ පර්යේෂණ නිලධාරීන් සඳහා පුරප්පාඩු - 2022

1. ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ පර්යේෂණ නිලධාරීන් සහ නිලධාරිණියන් සඳහා පුරප්පාඩු පවතී.

2. ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ පහත සඳහන් තනතුරු සඳහා පිරිමි/කාන්තා අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අ. *ප්‍රධාන සම්බන්ධීකාරක (ව්‍යාපෘති) - සමුද්‍රීය පක්ෂාංගය*

| | | |
|---|---|---|
| නිලය | - | කපිතාන් / කොමාණ්ඩර් (පිරිමි /කාන්තා). |
| අධ්‍යාපන සුදුසුකම් | - | යාන්ත්‍රික හෝ සමුද්‍රීය ඉංජිනේරු අංශයෙන් මහාචාර්ය හෝ ආචාර්ය උපාධියක් ලබා තිබීම සහ එම ක්ෂේත්‍රයේ වසර 05කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 50 ට අඩු විය යුතුය. |

ආ. *ව්‍යාපෘති පරීක්ෂක - ක්ෂුද්‍ර සහ නවීන තාක්ෂණික පක්ෂාංගය*

| | | |
|---|---|---|
| නිලය | - | ලුතිනන් කොමාණ්ඩර් (පිරිමි / කාන්තා). |
| අධ්‍යාපන සුදුසුකම් | - | ක්ෂුද්‍ර තාක්ෂණික අංශයෙන් ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම සහ එම ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 40 ට අඩු විය යුතුය. |

3. **අනෙකුත් සුදුසුකම් :**
අයදුම්කරුවන් ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුය.

| | | |
|---|---|---|
| අ. | පුරවැසිභාවය | - ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| ආ. | උස | - පිරිමි - අඟල් 65ට නොඅඩු විය යුතුය.<br>කාන්තා - අඟල් 63ට නොඅඩු විය යුතුය. |
| ඇ. | බර | - පිරිමි - කි.ග්‍රෑ. 52 ට නොඅඩු විය යුතුය.<br>කාන්තා - කි.ග්‍රෑ. 41 ට නොඅඩු විය යුතුය. |
| ඈ. | පපුව | - පිරිමි අඟල් 32 ට නොඅඩු විය යුතුය. |
| ඉ. | වර්ණ දෘෂ්ටිය | - එස්ටීඩී II (නිසි පෙනුම). |
| ඊ. | දෘෂ්ටි තීක්ෂණත්වය | - වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් හෝ අක්ෂි කාච සහිතව / රහිතව). |
| උ. | අධ්‍යාපන සුදුසුකම් | - අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී ගණිතය සහ ඉංග්‍රීසි විෂයන්වලට සම්මාන(C) සාමාර්ථ ලබා තිබිය යුතුය.<br>- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන අ. පො. ස. උසස් පෙළ විභාග සහතිකයේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබිය යුතුය (විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද උසස් පෙළ විභාග සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය). |
| ඌ. | සිවිල් තත්වය | - විවාහක/අවිවාහක. |

4. පර්යේෂණ ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡෙදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා නොමැති අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, වයස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිමිවලට අනුව උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුව ද නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ ඇය ගැන සලකා බලනු ලැබේ.

6. *සේවා කොන්දේසි :*

අ. අපේක්ෂකයින් ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරී/නිලධාරිණී තනතුරු සඳහා බඳවාගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවක් හැදැරිය යුතු වේ.

ආ. ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුව ලැබීම සඳහා බඳවාගනු ලබන නිලධාරින්/ නිලධාරිණියන් සූදානමින් සිටිය යුතුයි.

ඇ. සියලුම නිලධාරින්/නිලධාරිණියන් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතු ය.

ඈ. පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව නිලධාරින්/නිලධාරිණියන් නාවික හමුදා නීතියට යටත් විය යුතුයි.

ඉ. අධිකාරිය සඳහා පුහුණුවන කාල සීමාව තුළ දී යම් නිලධාරියෙකු/නිලධාරිණියක හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම නිලධාරියා/නිලධාරිණිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නිලධාරියා/නිලධාරිණිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

ඊ. පුහුණුව ලබන කාල සීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි නිලධාරියෙකු/ නිලධාරිණියකගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ නිලධාරියා/නිලධාරිණිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග ගිවිසුමකට හා බැඳුම්කරයට ඇතුළත් විය යුතුයි.

උ. පුහුණුව ලබන කාල සීමාව තුළ නිලධාරින්/නිලධාරිණියන් හට නිලධාරි නිවාස තුළින් නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

ඌ. විවාහක නිලධාරින්/නිලධාරිණියන් සඳහා විවාහක නිවස්නයන් හි පවතින පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුළිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

7. **රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා :**
තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

8. වැටුප් හා දීමනා :

2020.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමණාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ.

| විස්තරය | ලුතිනන් කොමාණ්ඩර් (රු.) | කොමාණ්ඩර් (රු.) | කපිතාන් (රු.) |
|---|---|---|---|
| මූලික වැටුප | 60,965.0 | 62,595.0 | 76,175.0 |
| ජීවන වියදම් දීමනාව | 7,800.0 | 7,800.0 | 7,800.0 |
| නිළ ඇඳුම් දීමනාව | 525.0 | 525.0 | 525.0 |
| දුෂ්කර ලැගුම් දීමනාව | 600.0 | 600.0 | 600.0 |
| අමතර දීමනාව | 1,000.0 | 1,000.0 | 1,000.0 |
| විශේෂ අමතර දීමනාව | 3,000.0 | 3,000.0 | 3,000.0 |
| එකතුව | 73,890.0 | 75,520.0 | 89,100.0 |

අ. ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරින්/ නිලධාරිණියන් සඳහා පමණක් හිමිවේ.

ආ. සුදුසුකම් වැටුප අදාළ පරිදි මසකට උපරිම රු.637.50 ක් ගෙවනු ලැබේ.

ඇ. නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිණියට, කාලත්‍රයාට,දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

ඈ. කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට/නිලධාරිණියන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරි නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඉ. නිළ ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

ඊ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිණියට කාලත්‍රයාට,දරුවන්ට සහ යැපෙන්නන්ට).

උ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට/නිලධාරිණියන්ට රු. 3,200.0 සිට රු.7,700.0 දක්වා ගෙවල් කුළී දීමනාවක් හිමි වේ.

9. **අයදුම්කරුවන්ට උපදෙස් :**

අ. පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2022 මාර්තු මස 31 දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (බඳවාගැනීම්), නාවික හමුදා මූලස්ථානය, තැ. පෙ. 593" කොළඹ 01" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "පර්යේෂණ නිලධාරීන්- ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාව"යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවූ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-7195154/ 011-7195118 මගින් ලබා ගත හැක.

ආ. රාජ්‍ය සේවයේ(දෙපාර්තමේන්තු / සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්) හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා (දෙපාර්තුමේන්තුවේ /සංස්ථාවේ/ මණ්ඩලයේ / සිවිල් ආයතනයේ) මගින් ඉදිරිපත් කළ යුතුය.

ඇ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා එවිය යුතු ය.

(1). උප්පැන්න සහතිකය.
(2). අයදුම් කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන/උසස් අධ්‍යාපන/වෘත්තීය අධ්‍යාපන/උපාධි සහතික.
(3). පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය.
(4). මාස 06ක් ඇතුළත ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය.
(5). පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.
(6). මෑතක දී ලබා ගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් විය යුතුය).

ඈ. නියම කරන ලද අවස්ථාවන්හිදී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඉ. වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය.

ඊ. අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

10. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ඇය දඬුවම් සහිතව සේවයෙන් පහ කිරීමටද යටත් වේ.

11. **තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ :**

*අ.* ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එම පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරණු ලබයි.

*ආ.* ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා;

| වයස් කාණ්ඩය (අවුරුදු) | ස්ත්‍රී පුරුෂ භාවය | PUSH UPS (මිනිත්තු 2ක් තුල) | CURL UPS (මිනිත්තු 2ක් තුල) | කි. මී. 2.4 දුර දිවීම (මිනිත්තු) |
|---|---|---|---|---|
| 18 - 24 | පුරුෂ | 27 | 25 | 11 |
| | ස්ත්‍රී | 11 | 19 | 12 |
| 25 - 29 | පුරුෂ | 24 | 23 | 13 |
| | ස්ත්‍රී | 9 | 17 | 15 |
| 30 - 34 | පුරුෂ | 20 | 21 | 15 |
| | ස්ත්‍රී | 8 | 15 | 17 |
| 35 - 39 | පුරුෂ | 18 | 19 | 16 |
| | ස්ත්‍රී | 7 | 13 | 18 |
| 40 - 44 | පුරුෂ | 16 | 17 | 17 |
| | ස්ත්‍රී | 6 | 11 | 19 |
| 45 - 49 | පුරුෂ | 14 | 15 | 18 |
| | ස්ත්‍රී | 5 | 9 | 20 |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් ඉදිරි සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබයි. එසේ වුවද, යම් අයදුම්කරුවෙකු ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා අපේක්ෂිත මට්ටමින් සපුරා නොමැති වූවද සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ ඇය ගැන සලකා බලනු ලැබේ.

ඈ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් / විද්‍යුත් තැපැල මඟින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඉ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුණුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

ඊ. අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

උ. අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේය.

ඌ. බඳවාගන්නා ලද අයදුම්කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත නාවික පර්යේෂණ නිලධාරීන් ලෙස අනුයුක්ත කරනු ලැබේ.

එ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

*සටහන.-* මෙම ගැසට් නිවේදනය සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන්ම පළවේ. සිංහල සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

ඩීඑන්එස් උළුගේතැන්න, ආර්එස්පී*, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී
වයිස් අද්මිරාල්
නාවික හමුදාධිපති.

2022 මාර්තු මස 09 වැනි දින,
නාවික හමුදා මූලස්ථානය,
තැපෙ 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවට බඳවා ගන්නා පර්යේෂණ නිලධාරීන්/නිලධාරිණියන් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :——————————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න.
ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)
2. ඉල්ලුම් කරන තනතුර :——————————.
3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව):——————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
5. ස්ථිර ලිපිනය:——————————.
6. තැපැල් ලිපිනය:——————————.
7. විද්‍යුත් ලිපිනය:——————————.
8. උපන් දිනය:——————————.
9. (2022 මාර්තු මස 31 වැනි දිනට) වයස ඃ අවුරුදු ......., මාස ......., දින .......
10. උස ............(අඟල්.) පපුව ........(අඟල්.) බර ........(කි. ග්‍රෑ.)
11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :——————————.
12. දිස්ත්‍රික්කය :——————————.
13. ඡන්ද කොට්ඨාසය :——————————.
14. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————————.
15. දුරකථන (whatsapp) අංකය:——————————.
16. විවාහක හෝ අවිවාහක බව:——————————.
17. ස්ත්‍රී / පුරුෂ භාවය:——————————.
18. අධ්‍යාපනය ලැබූ/පාසල් :——————————.
19. පාසල සහ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර:——————————.

| පාසලේ/විශ්වවිද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) | | |
| | අ.පො.ස. (උ.පෙළ) | | |
| | වෙනත් | | |

20. පාසලෙන් / විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |
| | | | |

21. මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :———.

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න) :———.

24. පාසලේ/විශ්වවිද්‍යාලයේ/බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.

25. සන්නද්ධ සේවා/ස්වේච්ඡා බල සේනාවේ/ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :———.

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලුම් කර තිබේ ද? එසේනම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :———.

27. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේ ද? එසේනම් විස්තර සඳහන් කරන්න :———.

28. රාජ්‍ය අංශයෙහි දෙපාර්තමේන්තුවක/මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකුව, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර/ සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :———.

29. **චරිත සහතික පිළිබඳ විස්තර :**

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

30. අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

03-242

**ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

**ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) සේවා ගණයේ විවෘත බඳවා ගැනීම් සඳහා ඉල්ලුම්පත් කැඳවීම - 2022**

1.0 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පහත වගුවෙන් දැක්වේ.

| අනු අංක | අනුමත තනතුරු නාමය | පුරප්පාඩු |
|---|---|---|
| 1 | ඇලුමිනියම් පිරි සැකසුම්කරු සහායක - Aluminium Fabricator Assistant | 02 |
| 2 | ඉදිකිරීම් කර්මාන්තකරු (පෙදරේරුකරු) සහායක -Mason Assistant | 01 |
| 3 | විදුලි දොඹකර ක්‍රියාකරු -Overhead Crane Operator | 02 |
| 4 | අහුකොන් කපන්නා -Fetler | 03 |
| 5 | යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) සහායක -Machine Operator (Production Assistant) | 01 |
| 6 | පොරාදුකරු සහායක -Hood maker & Upholster Assistant | 01 |
| 7 | උඳුන්කරු සහායක -Furncemen Assistant | 01 |
| 8 | වාත්තුකරු සහායක -Molder Assistant | 04 |
| 9 | වාත්තුමල්කරු සහායක -Pattern Marker Assistant | 01 |
| 10 | කෙමිකල් ක්ලීනර් (පවුඩර් කෝටින්) - Chemical Cleaner (Powder Coar-ting) | 02 |
| | එකතුව | 18 |

3.0 වැටුප් පරිමාණය :-

3.1 වැටුප් කේත අංකය - PL 2 2016
3.2 වැටුප් පරිමාණය - රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450

4.0 තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ.)

5.0 බඳවා ගැනීමේ ශ්‍රේණිය - III ශ්‍රේණිය

6.0 භාෂා මාධ්‍යය : සිංහල හා දෙමළ මාධ්‍යය

7.0 පැවරෙන කාර්යය භාරය :

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| ඇලුමිනියම් පිරිසැකසුම්කරු සහායක | ඇලුමිනියම් පාර්ටිෂන් සවිකිරීමට අදළ කටයුතුවල දී සහය ලබාදීම |
| ඉදිකිරීම් කර්මාන්තකරු (පෙදරේරුකරු) සහායක | ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම්වල දී අවශ්‍ය සියලු පෙදරේරු කටයුතුවල දී සහය වීම. |
| විදුලි දොඹකර ක්‍රියාකරු | යාන්ත්‍රික හා විදුලි දොඹකර ක්‍රියාකරවීම හා ඒවායේ සුළු නඩත්තු කටයුතු ඉටු කිරීම |

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| අහුකොන් කපන්නා | වාත්තුවලින් ලබා ගන්නා වාත්තු කොටස් නියමිත ආයුධ භාවිතා කරමින් එම කොටස් පිරිසිදු කිරීම |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) සහායක | ඇණ සාදන යන්ත්‍ර, කියත් අලුත්වැඩියාවන් ආදී යන්ත්‍ර ක්‍රියාක-රවීම සහ ඒවායේ සුළු නඩත්තු කටයුතු සඳහා සහය වීම |
| පොරෝදුකරු සහායක | සියලු කුෂන් වැඩ කිරීම, තිර රෙදි මසා සවිකිරීම, උත්සවවලදී කාපට් හා රැලි පාලම් ආදිය ආදී කටයුතුවලදී සහය වීම |
| උඳුන්කරු සහායක | සියලු වාත්තු ගැනීමේදී අවශ්‍ය වන උඳුන් ක්‍රියාත්මක කරවීම හා උඳුන් අලුත්වැඩියා කටයුතුවලදී සහය වීම |
| වාත්තුකරු සහායක | වාත්තු ගැනීමට අවශ්‍ය වන වාත්තු අච්චු සෑදීම, වාත්තුව සඳහා ඒවා සූදානම් කිරීම හා වාත්තු ගැනීමේ කටයුතුවලදී සහය වීම |
| වාත්තුමල්කරු සහායක | වාත්තු අච්චු සෑදීම සඳහා අවශ්‍ය වන වාත්තුමල් ලී වලින් සෑදීම සඳහා සහය වීම |
| කෙමිකල් ක්ලීනර් (පවුඩර් කෝටින්) | පවුඩර් කෝටින් කිරීමට ඇති භාණ්ඩ කෙමිකල් යොදා පිරිසිදු කිරීම හා පවුඩර් කෝටින් කිරීමේදී ඊට අදළ කටයුතු සඳහා සහය වීම |

8.0 මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් ය. පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂි හේතූන් මත එම කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට පත්වීම් බලධරයා හට බලය ඇත.

9.0 සුදුසුකම් :-

(i) ***අධ්‍යාපන සුදුසුකම්*** :
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06ක් සමත්වී තිබීම.

*සටහන* :-

i. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2016ට අනුව ක්ෂේත්‍රයට අදළව NVQ 03 වන මට්ටමේ නිපුණතාවයක් ලබා ඇත්නම් අංක I යටතේ සඳහන් කර ඇති අධ්‍යාපන සුදුසුකම් අදල නොවේ.

(ii) ***වෘත්තීය සුදුසුකම්*** : එක් එක් තනතුරෙහි කාර්යය භාරයට අදලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා දෙවන මට්ටමට (NVQ 02) නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා මනා ලෙස ලිවීමේ හා කියවීමේ හැකියාව තිබිය යුතුය.

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වෘත්තීය සුදුසුකම් :-**

| *අනුමත තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| ඇලුමිනියම් පිරිසැකසුම්කරු සහායක | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම හා ඇලුමිනියම් පිරිසැකසීම සම්බන්ධව අවම වශයෙන් වසර 02 පළපුරුද්දක් ලබා තිබීම. |
| ඉදිකිරීම් කර්මාන්තකරු (පෙදරේරුකරු) සහායක | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම සහ ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධව අවම වශයෙන් වසර 02ක පළපුරුද්දක් ලබා තිබීම. |

| *අනුමත තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| විදුලි දොඹකර ක්‍රියාකරු | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම විදුලි දොඹකර ක්‍රියා කරවීම සම්බන්ධව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |
| අහුකොන් කපන්නා | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම සහ පිළිගත් ආයතනයක වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) සහායක | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු යන්ත්‍ර ක්‍රියාකරු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම සහ නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |
| පොරොදුකරු සහායක | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ පිළිගත් ආයතනයක වර්ෂ 02ක පළපුරුද්දක් පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතු ය. |
| උඳුන්කරු සහායක | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම සහ පිළිගත් ආයතනයක වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |
| වාත්තුකරු සහායක | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු වාත්තු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ වාත්තුකරුවෙකු වශයෙන් පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |
| වාත්තුමල්කරු සහායක | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක එක් වසරකට නොඅඩු වාත්තුමල් පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ වාත්තුමල් සෑදීම සම්බන්ධ අවම වශයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |
| කෙමිකල් ක්ලීනර් (පවුඩර් කෝටින්) | I. NVQ 02 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම<br>හෝ<br>II. පිළිගත් කාර්මික පුහුණු ආයතනයක පවුඩර් කෝටින් එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම සහ පිළිගත් ආයතනයක වර්ෂ 02 ක පළපුරුද්දක් ලබා තිබීම. |

(iii) *පළපුරුද්ද* : අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ.

(iv) *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(v) *වෙනත්* :
i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

10.0 වයස : අයදුම්පත් කැඳවන අවසන් දිනට අවු. 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය.

11.0 බඳවා ගැනීමේ ක්‍රමය :-යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | ලකුණු ලබා දෙන ක්‍රමය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | ● අ.පො.ස. (උසස්/පෙළ) විභාගයේ එක් විෂයකට ලකුණු 3 බැගින් විෂයන් 3 සඳහා ලකුණු 09ක් ද | ලකුණු 09 |
| | | ● පිළිගත් ආයතනයක වසරකට නොඅඩු ඩිප්ලෝමා හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා ඇති අයට ලකුණු 03ක් | ලකුණු 03 |
| | | ● පූර්ණ කාලීනව මාස 06ක් හෝ සම්මත පැය ගණන සම්පූර්ණ කළ සහතික පත්‍ර පාඨමාලා සඳහා ලකුණු 03ක් | ලකුණු 03 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 | සුදුසුකම් ඉල්ලුම් කරනු ලබන ක්ෂේත්‍රයේ NVQ 3 මට්ටම හෝ ඊට වැඩි සුදුසුකම් සඳහා ලකුණු 25ක් හිමි වේ. | ලකුණු 25 |
| | | වෙනත් ක්ෂේත්‍රයක NVQ 3 මට්ටම හෝ ඊට වැඩි සුදුසුකම් සඳහා ලකුණු 10ක් හිමි වේ. | ලකුණු 10 |
| අතිරේක පළපුරුද්ද | 45 | පිළිගත් රජයේ/පෞද්ගලික ලියාපදිංචි ආයතනයක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද උපරිම වසර 05ක් දක්වා එක් වසරකට ලකුණු 09ක් හිමි වේ. | ලකුණු 45 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ දී පිළිබිඹු කරන කුසලතා නායකත්වය, ආකල්ප, පෞරුෂත්වය හා සන්නිවේදන කුසලතාවය සඳහා ලබාදෙන ලකුණු | 05 | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා-වය අනුව ලකුණු ලබා දේ. | ලකුණු 05 |
| එකතුව | | | 100 |

**සටහන** - තනතුරට ලබා ඇති පළපුරුද්ද පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණය :**

| විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂය දනුම | පැය 03 | 100 | 40 |

| තනතුරු නාමය | විෂය නිර්දේශය |
|---|---|
| ඇලුමිනියම් පිරිසැකසුම්කරු සහයක | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා අල්මාරියක් පිරිසැකසීම.<br>● නාන කාමර සඳහා ආවරණයක් පිරිසැකසීම සහ සවි කිරීම.<br>● සිවිලිමක් පිරිසකසා සවි කිරීම. |
| ඉදිකිරීම් කර්මාන්තකරු (පෙදරේරුකරු) සහායක | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● ගල් බිත්ති පෙදරේරු වැඩ(රබල් මේසනරි)<br>● ගඩොල්/බ්ලොක් ගල් පෙදරේරු වැඩ<br>● තෙත් වර්ණ තට්ටුව යෙදීම.<br>● ඇතිරුම් වැඩ කිරීම |
| විදුලි දොඹකර ක්‍රියාකරු | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● දොඹකරය ක්‍රියා කරවීම සඳහා සූදානම් කරවීම.<br>● බර උසුලන යන්ත්‍රය මගින් බරක් නිසි පරිදි සම්බන්ධ කර මෙහෙයවීම.<br>● බරක් නිසිපරිදි හැසිරවීම.<br>● සුළු සීරුමාරු සහ සුළු අලුත්වැඩියා කිරීම. |
| අහුකොන් කපන්නා | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● වාත්තුවක අහුකොන් ග්‍රයින්ඩින් යන්ත්‍ර මගින් කපා නිමකල හැකි විය යුතුයි.<br>● දෙන ලද වැඩක් ආයුධ භාවිතා කර ප්‍රමිතියකට අනුව ශුද්ධ කිරීම. |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) සහායක | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● කම්මල් හැඩ තලන යන්ත්‍ර සහ පීඩක ක්‍රියාකරවීම සහ දෛනික නඩත්තු කළ හැකි විය යුතුයි.<br>● බෝල්ට් ඇණ, හැඩතලන යන්ත්‍ර ක්‍රියාකරවීම සහ නඩත්තු කිරීම කළ හැකි විය යුතුයි. ද්‍රව පීඩක යන්ත්‍ර ක්‍රියාකරවීම සහ දෛනික නඩත්තු කළ හැකි විය යුතුයි. |
| පොරාදුකරු සහායක | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● මහන මැෂිම ක්‍රියාකරවීම සහ අතින් මැසිය හැකිවිය යුතුයි.<br>● වාහනයක ආසනය කුෂන් කිරීම සඳහා මාර්ක් කර කපා සකස් කිරීම සහ පැති ජනේල සඳහා ආවරණ සැකසීම.<br>● වාහනයක හුඩ්(වහලය) සඳහා සහ පැති සඳහා ජනෙල් කැන්වස් යොදා සැකසීම හෝ දෙන ලද පැච් වැඩක් කිරීම |
| උඳුන්කරු සහායක | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● දෙන ලද පිරිවිතරයකට අනුව උඳුන/කියුපෝලාව ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා ලෝහවල නියමිත බර හඳුනා ගෙන කිරා උඳුන/කියුපෝලාව නිසි පරිදි ක්‍රියාකරවීම.<br>● ෆර්නසය ක්‍රියාකරවීම ආරම්භ කර අවශ්‍ය ලෝහ කොටස් උනුකර අපද්‍රව්‍ය ඉවත්කර ද්‍රවණය වූ ලෝහය ලබා ගෙන ෆර්නසය භාර අධීක්ෂණ නිලධාරියා විසින් ලබාදෙන උපදෙස් පරිදි එය නවතා දැමීමට හැකි විය යුතුයි.<br>● කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්, බර්නර්ස්, ඔසවන සහ අමුද්‍රව්‍ය ඇතුලත් කරන උපකරණ, සහ බර කිරන සියලුම යන්ත්‍ර ක්‍රියාකර හැකි විය යුතුයි.<br>● උඳුන/කියුපෝලාව/ලේඩලය නැවත වාත්තු ගැනීම සඳහා සකස් කිරීම සහ අලුත්වැඩියා කිරීම සහ ලිප වැසීම සඳහා අවශ්‍ය වන ෆයර් ක්ලේ ප්ලග් සැකසීම. |

| | |
|---|---|
| වාත්තුකරු සහායක | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● අමු පස් හෝ වියලි අරු පස් යොදාගෙන කොටස් දෙකක හෝ තුනක මධ්‍යම ප්‍රමාණයේ වාත්තු අච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් වාත්තුවක් සඳහා පිළියෙල කළ යුතුයි.<br>● සාදන ලද අච්චුව වාත්තු පරීක්ෂණයකට සතුටුදායක ලෙස භාජනය කළ හැකි විය යුතුයි.<br>● ෆෙරස් සහ නිෆෙරස් වැඩ සඳහා භාවිතාවට ගන්නා අමුපස් සහ වියලි අරු පස් සම්මත අනුපාතයන් සහ පස් මිශ්‍රනයන් ගැන දැනගත යුතු වන අතර ඒවා සැදීමට හැකිවිය යුතුයි.<br>● සරල කොටස් දෙකක වාත්තු අච්චු තැලීම, වා තව්ලැම, සහ එකලස් කිරීම අතින් හෝ යන්ත්‍ර භාවිතයෙන් කළ හැකිවිය යුතුයි. |
| වාත්තුමල්කරු සහායක | ප්‍රායෝගික පරීක්ෂණයක පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● කෝර ප්‍රින්ට් භාවිතා කිරීමට අදාළව දෙන ලද සැලසුමකට අනුව වාත්තු මලක් සැදීම<br>● 2 1/2" x 1/2'' ටී මෝර්ටිය සහ ටෙන්ට් ජොයින්ට් පරීක්ෂණ කාලය තුල නිම කිරීම |
| කෙමිකල් ක්ලීනර් (පවුඩර් කෝටින්) | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>● ෆෙරස් සහ නිෆෙරස් ලෝහ සඳහා පිරිසිදු කිරීමේ දී වඩාත් උචිත පොදුවේ භාවිත කරන පිරිසිදු කිරීමේ ක්‍රමවේදය පිළිබඳ දැන සිටිය යුතුයි.<br>● පවුඩර් ආලේපිත පෘෂ්ඨ පිරිසිදු කර නැවත පවුඩර් ආලේප කිරීමට රසායනික පිරිසිදු කිරීම කරන ආකාරය ගැන දැනුමක් තිබිය යුතුයි.<br>● හොඳ ප්‍රමිතියක ෆොස්ෆේට් ආවරණයක් ලබාගන්නා ආකාරය දැනසිටිය යුතුයි. |

12.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කළ හැක.

13.0 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. නිවේදනයේ ඇතුළත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14.0 *අත්සන සහතික කිරීම*.-අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිළධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුද ාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු ලවා සහතික කර ගත යුතුය. දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

15.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් වෘත්තීය ප්‍රායෝගික හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

16.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් කළ යුතුය.
i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

17.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

18.0 ඉල්ලුම් කළ යුතු පිළිවෙල :-
සියලු විස්තර ඇතුලත් කරමින් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද සනාථ කරන සහතිකවල පිටපත්ද සමග 2022.04.18 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, ''අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව පාර, කොලොන්නාව'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ "ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම - (2022)" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඉංජි. කේ. පී. වතුගේ,
අධ්‍යක්ෂ ජනරාල්.

2022 මාර්තු මස 08 දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොලොන්නාව පාර, කොලොන්නාව.

ආදර්ශ අයදුම්පත්‍රය

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම

කාර්යාලයීය ප්‍රායෝජනය සඳහා

අයදුම්කරන භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

ඉල්ලුම් කරන තනතුර හෝ තනතුරු :-

| අනු අංක | තනතුර | අනු අංකය | තනතුර |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

1. මුලකුරු සමග නම :————.

2. සම්පූර්ණ නම :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :

4. ස්ථිර ලිපිනය :————.

5. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

6. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

7. අධ්‍යාපන සුදුසුකම් :

7.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

විභාග අංකය :————.

i. පළමුවර ප්‍රතිඵල : වර්ෂය :————. මාසය :————.

| | විෂයය | ශ්‍රේණිය | | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

ii. දෙවන වර ප්‍රතිඵල : වර්ෂය :————. මාසය :————.

| | විෂයය | ශ්‍රේණිය | | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

8. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

8.1 වෙනත් අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

වර්ෂය :————. මාසය :————.

| | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

8.2 ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලා :-

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

9. තනතුරට අදාළව ලබා ඇති සේවා පළපුරුද්ද ඃ

.........................................................................................................
.........................................................................................................
.........................................................................................................
.........................................................................................................
.........................................................................................................

10. වෘත්තීය සුදුසුකම් ඃ

.........................................................................................................
.........................................................................................................
.........................................................................................................
.........................................................................................................
.........................................................................................................

11. අතිරේක වෘත්තීය සුදුසුකම් ඃ

.........................................................................................................
.........................................................................................................
.........................................................................................................
.........................................................................................................

12. දැනට කිසියම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර ඃ

i. තනතුර හා ශ්‍රේණිය :————.
ii. පත් වූ දිනය :————.
iii. ආයතනය :————.
iv. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් ද යන වග :————.

13. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවෙහි ✓ ලකුණ යොදන්න. ඔව් නම් විස්තරය සඳහන් කරන්න)

| ඔව් | නැත |
|---|---|
| ☐ | ☐ |

14. අයදුම්කරුගේ සහතිකය ඃ

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකුවන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .............................. නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ............... දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.

සහතික කරන්නාගේ නම : ..........................................................................
තනතුර : ..........................................................................
ලිපිනය : ..........................................................................
නිල මුද්‍රාව : ..........................................................................

16. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

.............................. මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

දිනය :————.

සහතික කරන්නාගේ නම ..........................................................................
තනතුර ..........................................................................
ලිපිනය ..........................................................................
නිල මුද්‍රාව ..........................................................................

03-193

---

**ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

**ප්‍රාථමික ශිල්පීය සේවා (PL 3) ශ්‍රේණියේ විවෘත බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම - 2022**

1.0 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පහත වගුවේ දැක්වේ.

| අනුමත තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| ඇලුමිනියම් පිරි සැකසුම්කරු (Aluminium Fabricator) | 01 |
| කෝරකරු (Core Maker) | 01 |
| විදුලි මෝටර් එතුම්කරු (Electric Motor Winder) | 01 |
| විද්‍යුත් ලෝහාලේපකරු (Electroplater) | 01 |
| පිරිසැකසුම්කරු ලෝහ (Metal Processor) | 06 |
| බර වාහන ක්‍රියාකරු (Heavy Vehicle Operator) | 03 |
| ශීතකරණ හා වායු සමීකරණ කාර්මික (Refrigeration and air Condition Operator) | 01 |
| පෑස්සුම්කරු (Welder) | 03 |
| උඳුන්කරු (Furnceman) | 02 |
| වාත්තුකරු (Molder) | 01 |
| **එකතුව** | **20** |

3.0 වැටුප් පරිමාණය :-

3.1 වැටුප් කේත අංකය - PL 3 - 2016

3.2 වැටුප් පරිමාණය - රු. 25,790/- 10x270/- 10 x 300/- 10 x330/- 12 x350/- රු. 38,990/-

3.3 ආරම්භක වැටුප් පියවර -

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය (රු.)* |
|---|---|---|
| III | පියවර 01 | රු. 25,790 |
| II | පියවර 12 | රු. 28,790 |
| I | පියවර 22 | රු. 31,820 |
| විශේෂ | පියවර 32 | රු. 35,140 |

- රජයේ කර්මාන්තශාලාවේ ඇති C, CE සහ J පන්තිවල වාහන ක්‍රියාකරවීම සඳහා නියමිත බලපත්‍ර සහිතව එම පන්ති වලට අයත් වාහන ක්‍රියාකරවීමට බඳවා ගනු ලබන බර වාහන යන්ත්‍ර ක්‍රියාකරුවන් පමණක් එම වැටුප් පරිමාණයේ 4 වන වැටුප් තලයේ පිහිටුවීමටත් කටයුතු කරනු ලැබේ.

4.0 තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය :- ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුවේ.

5.0 බඳවා ගැනීමේ ශ්‍රේණිය :- III ශ්‍රේණිය

6.0 භාෂා මාධ්‍යය :- සිංහල හා දෙමළ මාධ්‍යය

7.0 පැවරෙන කාර්යය භාරය :-

| *අනුමත තනතුරු නාම* | *කාර්යයන්* |
|---|---|
| ඇලුමිනියම් පිරිසැකසුම්කරු | ඇලුමිනියම් පාර්ටිෂන් සවිකිරීමට අදාළ කටයුතු කිරීම හා ඒ සඳහා ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| කෝරකරු | වාත්තු කිරීම්වල දී අවශ්‍යවන සියලුම ආකාරයේ කෝරා සෑදීම, එම කෝර සෑදීම සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| විදුලි මෝටර් එතුම්කරු | විදුලි මෝටර්වල සියලු විද්‍යුත් අලුත්වැඩියා කටයුතු කිරීම, ආමේචර් එතීමේ කටයුතු කිරීම හා ඒ සඳහාවන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| විද්‍යුත් ලෝහාලේපකරු | විද්‍යුත් ලෝහ ආලේපනවලට අවශ්‍ය බාත් සකස්කර ගැනීම, ආලේපන කටයුතු කිරීම, ඔක්සයිඩ් කිරීම හා සුදු යකඩ, පිත්තල භාණ්ඩ පොලිෂ් කිරීම හා ඒ සඳහාවන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |

| *අනුමත තනතුරු නාම* | *කාර්යයන්* |
|---|---|
| පිරිසැකසුම්කරු (ලෝහ) | රෝහල් සඳහා උපකරණ සෑදීම, තහඩු යොදා ආකෘති සකස් කිරීම, තහඩුවලින් අකුරු කැපීම හා තීන්ත ආලේපන කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| බර වාහන ක්‍රියාකරු | බර වාහන ක්‍රියාත්මක කරවීම හා එම වාහනවල සුළු සේවා කටයුතු කිරීම. |
| ශීතකරණ හා වායු සමීකරණ කාර්මික | සියලුම වර්ගයේ වායු සමීකරණ සේවා කිරීම හා අලුත්වැඩියා කටයුතු කිරීම හා එම ක්‍රියාවන් සඳහා ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| පෑස්සුම්කරු | ගෑස්, විද්‍යුත්, ටිග් සහ මිග් යන්ත්‍ර භාවිතා කරමින් සියලුම පෑස්සුම් කටයුතු (පිත්තල, ඇළුමිනියම්, යකඩ, චීනච්චට්ටි හා සුදු යකඩ පෑස්සුම් කටයුතු කිරීම) මෙම කාර්යයන් සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| උඳුන්කරු | සියලු වාත්තු ගැනීමේ දී අවශ්‍යවන උඳුන් ක්‍රියාත්මක කරවීම හා උඳුන් අලුත්වැඩියා කටයුතු කිරීම හා ඒ සඳහාවන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| වාත්තුකරු | වාත්තු ගැනීමට අවශ්‍යවන වාත්තු අච්චු සෑදීම සඳහා ඒවා සූදානම් කිරීම හා වාත්තු ගැනීමේ කටයුතු කිරීම හා ඒ සඳහාවන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |

8.0 මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. පත්කිරීම බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂි හේතුන් මත එම කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට පත්වීම් බලධරයා හට බලය ඇත.

9.0 සුදුසුකම් :-

(I). අධ්‍යාපන සුදුසුකම් :
අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම.

***සටහන*** :- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2016ට අනුව ක්ෂේත්‍රයට අදාළව NVQ 03 හෝ NVQ 04 වන මට්ටමේ නිපුණතාවයක් ලබා ඇත්නම් අංක 1 යටතේ සඳහන් කර ඇති අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවේ.

(II). වෘත්තීය සුදුසුකම් : එක් එක් තනතුරෙහි කාර්යය භාරයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q. 04) හතර මට්ටමට නොඅඩු නිපුණතාවයක් ලබා තිබීම.

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වෘත්තීය සුදුසුකම් :

| *අනු. අංකය* | *අනුමත තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| 1. | ඇලුමිනියම් පිරිසැකසුම්කරු | NVQ 04 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| 2. | කෝරකරු | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර එකක පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තිය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.<br>II. විශේෂ වැඩ සඳහා සුදුසු කෝර සැකිලි පෑස්සීම හෝ වාත්තු කිරීම පිළිබඳ සැලසුම් කිරීමේ හැකියාව තිබිය යුතුය.<br>III. විවිධ ප්‍රමාණයේ වැලි කෝර සහ හැඩ සඳහා වෙන්ටින් සහ බේකින් ක්‍රම පිළිබඳ දැනුම තිබිය යුතුය.<br>IV. කෝර පස් වැලි මිශ්‍රණයක් සාදාගෙන රැම් කර රේන්පෝස්කර වෙන්ට් ඩිලිවරි සහ ඩ්‍රෙස් කෝර සකස් කර කෝර පෙට්ටියක් සෑදීම.<br>V. ඔයිල් සෑන්ඩ් මිශ්‍රණය සෑදීම සහ එමගින් කෝර සෑදීමට හැකි විය යුතුයි.<br>VI. ෆෙරස් වැඩ සඳහා වියලි නිෆෙරස් විශේෂිත/ග්‍රීන්ඩ් සහ ලෝම් වර්ගයේ කෝර සෑදීමට අවශ්‍ය පස් මිශ්‍රණයක් නියමිත අනුපාතයට සකස් කර ගත හැකි විය යුතුයි.<br>VII. ලෝම් සෑන්ඩ් මගින් පයිප්ප කෝර සෑදීම සහ එම මාධ්‍යයේම ආධාරක කෝර පෙට්ටි මත හෝ ටෙම්ප්ලේට් ආධාරක යොදා ගෙන කෝර සැකිලි සෑදීම කළ හැකි විය යුතුයි.<br>VIII. මෝල්ඩ් සෑදීම පිළිබඳ දැනුමක් සහ නිපුණතාවයෙන් උසස් මෝල්ඩ්කරුවකුවීම. |

| අනු. අංකය | අනුමත තනතුරු නාමය | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| 3. | විදුලි මෝටර් එතුම්කරු | NVQ 4 මට්ටමේ ප්‍රවීනතාවය ලබා තිබීම. |
| 4. | විද්‍යුත් ලෝහාලේපකරු | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර එකක පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තිය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත්කළ යුතුය.<br>II. විද්‍යුත් ලෝහාලේපනයට ගැනීමට පෙර පිරිසිදු කිරීමේ බාත් සෑදීමට ගන්නා විවිධ සෝල්ට් වර්ග සහ රසායන ද්‍රව්‍යවල අනුපාතයන් හොඳින් දැන සිටිය යුතුයි.<br>III. භාවිතයට ගත හැකි ඇනෝඩ වර්ග ගැන හොඳින් දැන සිටිය යුතුයි.<br>IV. නිකල් ප්ලේට් හෝ ක්රෝමියම් ප්ලේට් සඳහා පිරිසිදු කිරීමේ සහ විද්‍යුත් ලෝහාලේපන බාත් සෑදීමට හැකි විය යුතුයි.<br>V. පොලිෂින් මොප්ස් වර්ග තුනක් භාවිතාව ගැන හොඳින් දැන සිටිය යුතුයි.<br>VI. පොලිෂින් රෙදි, ෆයිබර් වයර් මොප්ස්, සහ එමරි වීල්ස් සමග භාවිත කරන විවිධ පොලිෂින් කොම්පවුන්ඩ් ගැන හොඳින් දැන සිටිය යුතුයි.<br>VII. දෙන ලද තහඩුවක් නිවැරදි ක්‍රමවේදයකට අනුව විවිධ පිරිසිදු කිරීමේ බාත් යොදා පිරිසිදු කර ගත හැකිවිය යුතුයි. ඉන් පසු පරීක්ෂාකර ක්‍රියාකාරිත්වය නිවැරදි දැයි තහවුරු කිරීම. |
| 5. | පිරිසැකසුම්කරු (ලෝහ) | NVQ 4 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| 6. | බර වාහන ක්‍රියාකරු | I. බර වාහන ක්‍රියා කරවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර (10) දහයක පිළිගත් ලියාපදිංචි ආයතනයක පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.<br>II. බර වාහනවල නඩත්තුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා තිබිය යුතුයි.<br>III. ප්‍රයිම් මූවර් ට්‍රෙලර් ක්‍රියාකරවිය හැකි විය යුතුයි.<br>IV. ක්‍රේන් යන්ත්‍රයක් ක්‍රියාකරවිය හැකි විය යුතුයි.<br>V. ලොරි සහ පෝක්ලිප්ට් ක්‍රියාකරවිය හැකි විය යුතුයි.<br>VI. NVQ 04 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| 7. | ශීතකරණ හා වායු සමීකරණ කාර්මික | NVQ 4 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| 8. | පෑස්සුම්කරු | NVQ 4 මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| 9. | උඳුන්කරු | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර එකක පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තිය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.<br>II. ෆෙරස් සහ නිෆෙරස් අංශවල ඇති විවිධ ලෝහ (ඇලෝයිස්) කොටස් කැඩීමෙන් හෝ අනිකුත් ක්‍රම මගින් හඳුනා ගත හැකි විය යුතුයි.<br>III. නන්ෆෙරස් ෆර්නස්, ක්රූසිබල්ස්, ක්රූසිබල් නොවන, ඔයිල් ෆයර්ඩ් ෆර්නස් සහ කියුපෝලා ක්‍රියා කරවීමට සහ අළුත්වැඩියා නඩත්තු කටයුතු කළ හැකි විය යුතුයි.<br>IV. කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්ස්, බර්නර්ස්, ඔසවන සහ අමුද්‍රව්‍ය ඇතුළත් කරන උපකරණ සහ බර කිරන සියලුම යන්ත්‍ර ක්‍රියා කරවිය හැකි විය යුතුයි.<br>V. ද්‍රාවණය කරන ලද ලෝහයේ උෂ්ණත්වය මැනීම සඳහා ෆයිරො මීටරයක් භාවිත කිරීමට මූලික දැනීමක් තිබිය යුතුයි.<br>VI. ෆෙරස්/නිෆෙරස් උණුකිරීම්වල දී යොදා ගන්නා කියුෆෝලා/ උඳුන්වලින් ටැප් කර ලබා ගන්නා ලෝහ ද්‍රාවණය හෝ ඉන්ධන සහ වාතයේ මිශ්‍රණ අනුපාතවලට අනුව පිටවන දුම පරීක්ෂා කිරීමෙන් ද්‍රවණය වෙමින් ඇති ලෝහයේ තාපය පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුයි.<br>VII.උණුකිරීම්වලට යොදා ගන්නා ඉන්ධන සහ ලෝහ අතර අනුපාත ගැන දැන ගත යුතුවන අතර වඩා ආර්ථික වශයෙන් ඵලදායී මට්ටම් මොනවාද යන්න දැන සිටිය යුතුයි. |

| අනු. අංකය | අනුමත තනතුරු නාමය | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| 10 | වාත්තුකරු | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.<br>II. ෆෙරස් සහ නිෆෙරස් වාත්තු සඳහා අමු පස්, වියළි සහ ලෝම් සහිත මිශ්‍රණයේ සංයුතිය තීරණය කර අදාළ අමුද්‍රව්‍යවලට උචිත වන අයුරු අදාළ වාත්තු ලබා ගැනීමට අච්චු මට්ටම් කටු යොදා කළ හැකි විය යුතුයි.<br>III. ෆෙරස් සහ නිෆෙරස් මාධ්‍යවල විවිධ කෝර වාත්තු අච්චු සාර්ථකව සෑදීමට හැකිවිය යුතුයි.<br>IV. ලෝම් පස්වලින් හැඩමල් වාත්තු අච්චු සෑදීම සඳහා දැනුමක් තිබිය යුතුයි.<br>V. දැනට ඇති අමුද්‍රව්‍ය යොදා ගෙන විශේෂ වැඩ සඳහා සහ සාමාන්‍යයෙන් භාවිතයට ගන්නා මොල්ඩින් පෙට්ටි රාමු, ඔසවනයන් සහ සිට්බලයන් පිරි සකස් කර වැඩි දියුණු කර ආර්ථික ඵලදායී ලෙස යොදා ගත හැකි විය යුතුයි.<br>VI. උණු කරන ලද ලෝහය සාමාන්‍යයෙන් පරීක්ෂා කර බලා එම ලෝහය වාත්තු අච්චුවලට වත් කිරීමට සුදුසු අවස්ථාව තීරණය කර ආධාරකරුවන් සහ ලැඩලය ක්‍රියාකරවන්නන් මෙහෙයවා වාත්තු ලබාගැනීමට හැකිවිය යුතුයි.<br>VII. ෆෙරස් සහ නිෆෙරස් වාත්තු වලදී යොදා ගන්නා විලින් තාක්ෂණය පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුයි.<br>VIII. කෝර සෑදීම පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතුයි. |

III. පළපුරුද්ද : රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02)ක පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

IV. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

V. වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III.තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

10.0 වයසඃ
10.1 අවම සීමාව : අවු. 18ට නොඅඩු
10.2 උපරිම සීමාව : අවු. 45ට නොවැඩි (අයදුම්පත් කැඳවන අවසන් දිනට)

11.0 බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයක හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

වෘත්තීය පරීක්ෂණය - ප්‍රායෝගික පරීක්ෂණයකි.

| විෂය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂය දැනුම | **1. ඇලුමිනියම් පිරිසැකසුම්කරු :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>(a) ජනේල පිරිසකසා සවි කිරීම<br>(b) දොරවල් පිරි සකසා සවි කිරීම<br>(c) කාර්යාල සහ වෙළඳ කාමර බෙදා වෙන් කිරීම, පිරිසකසා සවි කිරීම<br>(d) භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා අල්මාරියක් පිරිසැකසීම<br>(e) නාන කාමර සඳහා ආවරණයක් පිරිසැකසීම සහ සවිකිරීම<br>(f) සිවිලිමක් පිරිසකසා සවි කිරීම | පැය 01 | 100 | 40 |

| විෂය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂය දැනුම | (g) විවිධ ඇලුමිනියම් අයිතම පිරිසැකසීම<br>(h) ඉනිමගක් පිරිසැකසීම<br>(i) පඩි පෙළක් පිරිසැකසීම<br>(j) දොරවල් සහ පණ පදම්කළ වීදුරු සවි කිරීම.<br><br>2. **කෝරකරු :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>(a) කෝර පස් වැලි මිශ්‍රණයක් සාදාගෙන රැම් කර රේන්පෝස්කර වෙන්ට් ඩිලිවරි සහ ඩ්‍රෙස් කෝර සකස් කර කෝර පෙට්ටියක් සෑදීම.<br>(b) ෆෙරස්/ නිෆෙරස් වැඩ සඳහා අවශ්‍ය කෝර වැලි ගම් සහ ඩ්‍රෙසින් මිශ්‍රණයේ සංයුතිය නිවැරදිව යොදා ගෙන කෝරවැලි මිශ්‍රණය සාදා ගැනීම.<br>(c) විශේෂිත වැඩ, සංකීර්ණ සහ කෝර කිහිපයක් ඇති වැඩ පැකින් බ්ලොක් සඳහා කෝර සෙට් කිරීමේදී අවශ්‍ය (පැකින් බ්ලොක්) ටෙම්ප්ලේට් සහ ගේජස් යොදා සැකසීම<br>(d) ඔයිල් සැන්ඩ් මිශ්‍රණය සෑදීම සහ එමගින් කෝර සෑදීමට හැකි විය යුතුයි.<br><br>3. **විදුලි මෝටර් එතුම්කරු :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>(a) විද්‍යුත් යන්ත්‍රවල වයර් නැවත එතීම, අලුත්වැඩියාව සහ සේවා කිරීම පිළිබඳ මූලික පරීක්ෂාවක් කළ හැකි විය යුතුයි.<br>(b) විද්‍යුත් යන්ත්‍රවල ඇති විය හැකි දෝෂ පරීක්ෂාකර හඳුනා ගත හැකිවිය යුතුයි.<br>(c) විදුලි මෝටර් සහ ඔල්ටනේටර් එතීම සහ නැවත එතීම කළ හැකි විය යුතුයි.<br>(d) ට්‍රාන්ස්පෝමර් එතීම සහ නැවත එතිම කළ හැකි විය යුතුයි.<br><br>4. **විද්‍යුත් ලෝහාලේපකරු :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>(a) පිරිසිදු කිරීමේ සහ විද්‍යුත් ලෝහාලේපණය කිරීමේ බාත් සාදා ගත හැකිවිය යුතුයි.<br>(b) දෙන ලද තහඩුවක් නිවැරදි ක්‍රම වේදයකට අනුව විවිධ පිරිසිදු කිරීමේ බාත් යොදා පිරිසිදු කර ගත හැකිවිය යුතුයි.<br>(c) නිකල් හෝ ක්‍රෝමියම් තහඩු කැබලි බප් කර පිරිසිදු කර විද්‍යුත් ලෝහාලේපණ කර පොලිෂ් කිරීම.<br><br>5. **පිරිසැකසුම්කරු (ලෝහ) :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>(a) ලෝහ කැපීම සඳහා සලකුණු කිරීම කළ හැකි විය යුතුයි.<br>(b) පිරි සකසන ලද ලෝහ කොටස් එකලස් කළ හැකි විය යුතුයි.<br><br>6. **බර වාහන ක්‍රියාකරු :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>(a) මගී බස්රථයක් පැදවිය හැකි විය යුතුයි.<br>(b) භාණ්ඩ රැගෙන යන ලොරියක් පැදවිය හැකි විය යුතුයි.<br>(c) ෆෝර්ක් ලිෆ්ට් යන්ත්‍රයක් ක්‍රියා කරවිය හැකි විය යුතුයි.<br>(d) බර වාහනවල නඩත්තුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා තිබිය යුතුයි.<br><br>7. **ශීතකරණ හා වායු සමීකරණ කාර්මික :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>(a) වින්ඩෝස් සහ ස්පිලිට් වර්ගයේ වායුසමීකරණ සවිකිරීම<br>(b) වින්ඩෝස් සහ ස්පිලිට් වර්ගයේ වායුසමීකරණ අළුත්වැඩියා කිරීම | | | |

| විෂය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| | (c) සෙන්ට්‍රල් වායුසමීකරණ පද්ධතියක් සේවා කිරීම සහ අලුත්වැඩියා කිරීම.<br>(d) අධිශීතකරණ පද්ධතියක් සේවා කිරීම සහ අලුත්වැඩියා කිරීම.<br><br>8. **පෑස්සුම්කරු :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර හතරකින් සමත් විය යුතුයි.<br>NVQ 04 මට්ටම ආර්ක් පෑස්සුම<br>(a) ඔක්සි ඇසිටිලීන් ගෑස් මගින් වානේ කැපීම<br>(b) ප්ලෑට් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම (IG සහ IF)<br>(c) තිරස් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම<br>(d) සිරස් පිහිටීමේදී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම (3G)<br>(e) ඕවර්හෙඩ් ක්‍රමයට වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම (4G)<br>(f) සෝල්ඩරින් සහ බ්‍රේසීන් කිරීම<br>NVQ හතරවන මට්ටම ටිග් පෑස්සුම<br>(a) ඔක්සි ඇසිටිලීන් ගෑස් මගින් වානේ කැපීම<br>(b) ප්ලෑට් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම<br>(c) තිරස් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම<br>(d) සිරස් පිහිටීමේදී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (3G)<br>(e) ඕවර්හෙඩ් ක්‍රමයට වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (4G)<br>(f) සියලුම පිහිටීම්දී වානේ පයිප්ප ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (6G)<br><br>9. **උඳුන්කරු :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>(a) දෙන ලද පිරිවිතරයකට අනුව උඳුන/කියුපෝලාව ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය ලෝහ ද්‍රව්‍යවල නියමිත බර හඳුනාගෙන කිරා උඳුන/කියුපෝලාව නිසි පරිදි ක්‍රියා කරවීම.<br>(b) ෆෙරස්/ නිෆෙරස් අංශවල යොදා ගන්නා පොදු ලෝහ වර්ග හඳුනා ගත හැකි විය යුතු වන අතර කියුපෝලාවට යොදා ගත යුතු නිවැරදි කෝක් ග්‍රේඩය හඳුනා ගත හැකි විට යුතුයි.<br>(c) ෆර්නසය ක්‍රියා කරවීම ආරම්භ කර අවශ්‍ය ලෝහ කොටස් චාර්ජ් කර උනුකර අප ද්‍රව්‍ය ඉවත් කර ද්‍රාවණය වූ ලෝහය ලබා ගෙන ෆර්නසය තමා විසින්ම නවතා දැමීමට හැකි විය යුතු වන අතර උදව්කරුවන් යොදා ගෙන සාර්ථකව වාත්තුව ලබා ගත හැකි විය යුතුයි.<br>(d) කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්ස්, බර්නර්ස්, ඔසවන සහ අමුද්‍රව්‍ය ඇතුලත් කරන උපකරණ සහ බර කිරන සියලුම යන්ත්‍ර ක්‍රියා කරවිය හැකි විය යුතුයි.<br>(e) ෆෙරස්/ නිෆෙරස් අංශවල ඇති විවිධ ලෝහ (ඇලෝයිස්) කොටස් කැඩීමෙන් හෝ අනිකුත් ක්‍රම මගින් හඳුනා ගත හැකි විය යුතුයි.<br><br>10. **වාත්තුකරු :**<br>ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතුයි.<br>(a) අමු පස් හෝ වියලි අරු පස් යොදාගෙන සංකීර්ණ කොටස් තුනක හෝ දෙකක මධ්‍යම ප්‍රමාණයේ වාත්තු ආච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් වාත්තුවක් සඳහා පිළියෙල කළ යුතුයි. සාදන ලද අච්චුව වාත්තු පරීක්ෂණයකට සතුටුදායක ලෙස භාජනය කළ හැකි විය යුතුයි.<br>(b) කොටස් දෙකක හෝ තුනක වාත්තු අච්චුවක් සෑදීම සඳහා වියළි අරු පස් හෝ අමු පස් සකසා ගෙන සංකීර්ණ හෝ මධ්‍යම ප්‍රමාණයේ වාත්තු අච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් ලෝහ වලින් සෑදීම. මෙම වාත්තු අච්චුව සතුටුදායක ලෙස වාත්තු පරීක්ෂණයකට භාජනය කළ හැකි විය යුතුය. | | | |

යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *ලකුණු ලබා දෙන ක්‍රමය* | *ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අ.පො.ස (උසස්/පෙළ) විභාගයේ එක් විෂයකට ලකුණු 04 බැගින් විෂයය 3 සඳහා ලකුණු 12 ක් ද<br>පිළිගත් ආයතනයක වසරකට නොඅඩු ඩිප්ලෝමා හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා ඇති අයට ලකුණු 04ක්<br>පිළිගත් ආයතනයක වසරකට නොඅඩු සම්මත පැය ගණන සම්පූර්ණ කර ඇති සහතික පත්‍ර පාඨමාලා සඳහා ලකුණු 04ක් | ලකුණු 12<br>ලකුණු 04<br>ලකුණු 04 |
| සේවා පළපුරුද්ද | 40 | පිළිගත් රජයේ ලියාපදිංචි ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ නියමිත පළපුරුද්ද ඉක්මවා යන වසර 05ක් සඳහා එක් වසරකට ලකුණු 08ක් බැගින් | ලකුණු 40 |
| පුහුණු පාඨමාලා හදාරා තිබීම | 15 | සුදුසුකම් ඉල්ලුම් කරනු ලබන ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පුහුණු පාඨමාලා සඳහා ලකුණු 10 ක් ද යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වෙනත් පුහුණු පාඨමාලා සඳහා ලකුණු 05ක් ද, ලබා දේ. | ලකුණු 15 |
| විෂය බාහිර ක්‍රියාකරකම් | 20 | ක්‍රීඩා සහතික සඳහා පළාත් මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 5 ක් ද, සමස්ථ ලංකා මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 10ක් ද (1 ක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහා) පාසලේ ශිෂ්‍ය නායක තනතුරු සඳහා ලකුණු 05 ක් හිමි වේ. | ලකුණු 20 |
| සම්මුඛ පරීක්ෂණයේදී පෙන්වන කුසලතාවය | 05 | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය අනුව ලකුණු ලබා දේ. | ලකුණු 05 |
| එකතුව | | | 100 |

*සටහන* - තනතුරට ලබා ඇති පළපුරුද්ද පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුය.

12.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළිකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කළ හැක.

13.0 අත්සන සහතික කිරීම :- අයදුම්පත්‍රයේ ද, විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයෙකු ලවා සහතික කරගත යුතුය. දැනටමත් රාජ්‍ය ආයතනයක සේවය කරන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතුය.

14.0 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. නිවේදනයේ ඇතුලත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් වෘත්තීය ප්‍රායෝගික හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම

අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

16.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් ඉදිරිපත් කල යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

17.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

18.0 ඉල්ලුම් කලයුතු පිළිවෙල :-

සියලු විස්තර ඇතුලත් කරමින් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද, පුහුණු පාඨමාලා, විෂය බාහිර ක්‍රියාකාරකම් සනාථ කරන සහතික වල පිටපත් ද සමග 2022.04.18 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ''අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොලොන්නාව පාර, කොලොන්නාව.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහල කෙලවරේ ''ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ III වන ශ්‍රේණියට විවෘත බඳවා ගැනීම - (2022)'' යනුවෙන් පැහැදිලිව සඳහන් කල යුතුය.

සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ඉංජි. කේ. පී. වතුගේ,
අධ්‍යක්ෂ ජනරාල්.

2022 මාර්තු මස 09 වැනි දින,
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොලොන්නාව පාර,
කොලොන්නාව.

ආදර්ශ අයදුම්පත්‍රය

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව
ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අයදුම්කරන භාෂා මාධ්‍යය ඃ

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

ඉල්ලුම් කරන තනතුර හෝ තනතුරුඃ-

| අනු අංක | තනතුර | අනු අංක | තනතුර |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

1. මුලකුරු සමග නම : ........................................................................

2. සම්පූර්ණ නම : ........................................................................

........................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4. ස්ථිර ලිපිනය : ........................................................................

........................................................................

5. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

6. දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

7. අධ්‍යාපන සුදුසුකම් :

7.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

විභාග අංකය :————.

I. පළමුවර ප්‍රතිඵල : වර්ෂය :————. මාසය :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

II. දෙවන වර ප්‍රතිඵල : වර්ෂය ........................ මාසය ........................

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

8.1 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර

I. විභාගයේ වර්ෂය හා මාසය : ............................ ........................

II. විභාග අංකය : ............................ ........................

ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

8.2 ඩිප්ලෝමා/ සහතික පත්‍ර පාඨමාලා ፡

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

9. වෘත්තීය සුදුසුකම් : ..................................................................
..................................................................
..................................................................
..................................................................
..................................................................
..................................................................

10. තනතුරට අදාළව ලබා ඇති සේවා පළපුරුද්ද : ..................................................................
..................................................................
..................................................................
..................................................................
..................................................................
..................................................................

11. හදාරා ඇති පුහුණු පාඨමාලා :..................................................................
..................................................................
..................................................................
..................................................................
..................................................................
..................................................................

12. විෂයය බාහිර ක්‍රියාකාරකම් : ..................................................................
..................................................................
..................................................................

13. දැනට කිසියම් තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර ፡

I. තනතුර හා ශ්‍රේණිය : ..................................................................
II. පත් වූ දිනය : ..................................................................
III. ආයතනය : ..................................................................
IV. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් ද යන වග : ..................................................

14. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාළ කොටුවෙහි ✓ ලකුණ යොදන්න 'ඔව්' නම් විස්තරය සඳහන් කරන්න)

ඔව් ☐ නැත ☐

15. අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :————.                ————,
අයදුම්කරුගේ අත්සන.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .................................................................................................................
නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ................................................. දින ඔහු/ඇය මා ඉදිරිපිට අත්සන් තබන ලද බවත් සහතික කරමි.

දිනය :————.                ————,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ නම :..................................................................
තනතුර :..................................................................
ලිපිනය :..................................................................
නිල මුද්‍රාව :..................................................................

17. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

.......................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයකු/සේවිකාවක ලෙස සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

දිනය :————.                ————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

සහතික කරන්නාගේ නම :..................................................................
තනතුර :..................................................................
ලිපිනය :..................................................................
නිල මුද්‍රාව :..................................................................

03- 194

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල/දෙමළ) රෙජිස්ට්‍රාර් තනතුරු

### කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාලය හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුම 1'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2022 අප්‍රේල් මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 පෙබරවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | බේරුවල | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ මරදන ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
| කළුතර | පානදුර | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ එළුවිල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
| කළුතර | පාලින්ද නුවර | නැගෙනහිර පස්දුන් කෝරළය කොට්ඨාසයේ පැලෑන ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
| කළුතර | බේරුවල | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ මග්ගොනබද්ද ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
| කළුතර | බේරුවල | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ මිහිරිපැන්න ප්‍රදේශයේ අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
| කළුතර | බේරුවල | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ මිහිරිපැන්න ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
| කළුතර | බේරුවල | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ දර්ගා නගර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
| කළුතර | බුලත්සිංහල | නැගෙනහිර පස්දුන් කෝරළය කොට්ඨාසයේ වේයන්ගල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
| කළුතර | පානදුර | කළුතර හා පානදුර තොටමුණ කොට්ඨාසයේ තොටවත්ත ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |

03- 132

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.-* අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2022 අප්‍රේල් මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 පෙබරවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | මීගමුව | මීගමුව නගරය (රෝහලෙන් පිට) කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |

03-131

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

***සැ. යු.***- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

05. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර් ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01 ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතුය.

06. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

07. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරී වසම් ඇතුළත් ''ඇමුණුව I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2022 අප්‍රේල් මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 පෙබරවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | පානදුර | වාද්දුව නගරය කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |

03-130

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු — කොළඹ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2022 අප්‍රේල් මස 18 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේගුණවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 පෙබරවාරි මස 24 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කොළඹ | තිඹිරිගස්යාය | කොළඹ කොට්ඨාසයේ වැල්ලවත්ත ප්‍රදේශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ. |
| කොළඹ | කොළඹ | කොළඹ කොට්ඨාසයේ ශාන්ත සෙබස්තියන් පෙදෙස විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ. |

03-129

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව
පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා ආධුනියකයින් බඳවා ගැනීම - 2022 ජූලි

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන මොරටුව කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි (IETI) පහත සඳහන් පාඨමාලා හැදෑරීම සඳහා තරුණ තරුණියන් ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. පවත්වනු ලබන පාඨමාලා :

| | *පාඨමාලා විස්තර* | *ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)* | *කාලය* |
|---|---|---|---|
| 01, 02,03, 04,05 වෘත්තීන් සඳහා අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී ගණිතය හෝ විද්‍යාව සඳහා සම්මාන සාමාර්ථයක් සමග අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය සහ විද්‍යාව සමග විෂයයන් 6 ක් සමත් වී තිබීම හෝ. අ.පො.ස. (උ. පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය හෝ තාක්ෂණය සඳහා විද්‍යාව යන විෂයයන් 02 න් එක් විෂයකට සාමාර්ථයක් ලබා තිබීම හා අ.පො.ස. (සා. පෙළ) සිංහල භාෂාව, විද්‍යාව. සහ ගණිතය ඇතුළුව විෂයයන් 6 ක් සමත් වී තිබීම. | | | |
| 01. | **ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී (විශේෂ) Electronics Electrician (Special)** (Basic Work Shop practice, Domestic Electrical Installation, Analog and Digital Electronic, Industrial Electronic, PLC, Micro Controller, (PIC and Arduino) and Project Works | - | අවු 03 |
| 02. | **විදුලි කාර්මික ශිල්පී (විශේෂ) - Electrician (Special)** මූලික වැඩහල් පුහුණුව, ගෘහස්ත හා කර්මාන්තශාලා විදුලි පරිපථ, විදුලි මිනුම් උපකරණ, ගෘහස්ථ/කර්මාන්තශාලා ආරක්ෂක හා සන්නිවේදන පද්ධති වායු පාලන තාක්ෂණය, PLC තාක්ෂණය, ඩිජිටල් ඉලෙක්ට්‍රොනික්ස්, ඔටෝමේෂන් පද්ධති | 4 මට්ටම | අවු 03 |

| | පාඨමාලා විස්තර | ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | කාලය |
|---|---|---|---|
| 03 | **ඉදිකිරීම් සුපරීක්ෂක- Construction Supervisor** (Construction Management, Basic Workshop Practice, Basics in Construction Technology, Basics in Engineering and Architectural Drawings and Auto Cad, Construction Materials, Surveying and Levelling, Water Supply, Drainage and Sewerage Systems, Road Construction and Quantity Serveying and Cost Estimates) සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දුවැන්ත සමාගම් සහ වැඩබිම් පුහුණුව | 4 වන මට්ටම | අවු 01 1/2 |
| 04 | **ප්‍රමාණ සමීක්ෂණ සහකාර Quantity Serveying Assistant** (Preparation of BOQ for small and medium constriuction, Pricing of BOQ, Prepare Bidding Document) | 4 වන මට්ටම | අවු 01 |
| 05 | **සැළසුම් ශිල්පි (Draftsperson)** (Building Construction, Building Services, Mathematics, Geometrical and Mechanical Drawings, Surveying and Levelling CAD Drawings, Drawing Office activities, Building Services Drawings) | 4 වන මට්ටම | අවු 01 1/2 |
| 06, 07 වෘත්තීන් සඳහා අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ගණිතය ඇතුලුව විෂයයන් 06 කින් සමත්වීම. | | | |
| 06. | **ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී -Refrigeration and Air Conditioning Machanic** සියලුම වර්ගයේ ශීතකරණ, ගෘහස්ත හා කාර්මාන්තශාලා වායු සමන පද්ධති | 4 වන මට්ටම | අවු 02 |
| 07 | **යන්ත්‍ර කාර්මික ශිල්පි (විශේෂ) Machinist (Special)** Lathe, Milling, Grinding Machine Operation, Pneumatic and Hydraulic Systems, Heat Treatment, CNC Programming, CNC Maching, EDM Process, Wire Cutting Process, LASER Cutting Solid Works Auto Cad | 4 වන මට්ටම | අවු 03 |
| 08, 09 වෘත්තීන් සඳහා අ.පො.ස. (සා පෙළ) විභාගයේදී සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුලුව විෂයයන් 06 කින් සමත්වීම. | | | |
| 08. | **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී - Information and Communication Technology Technician** (Maintain files and Folders, Ms World, Ms Excel, Ms power Point, Maintain Database (Ms Access), Internet and E-mail, Install and Configure operating system, Installation and Troubleshooting of Network, Graphic for Web, Design Static Web pages, Develop Basic Software Solution) | 4 වන මට්ටම | අවු 01 |
| 09. | **පරිගණක චිත්‍ර නිර්මාණ ශිල්පී Computer Graphic Designer** (Adobe Photoshop, Adobe Illustrator, Adobe Indesign, Coral Draw, Printing and Scanning Method) | 4 වන මට්ටම | අවු 01 |
| 10, 11, 12, 13, 14 වෘත්තීන් සඳහා අවම වශයෙන් අ.පො.ස. (සා. පෙළ) දක්වා අධ්‍යාපනය ලැබීම | | | |
| 10. | **පෑස්සුම් ශිල්පී (විශේෂ) Welder (Special)** (MMA/GAS/TIG/MIG/MAG/FCAW/PLASMA/SPOT/STUD Welding ශිල්පීය ක්‍රම Destructive and Non Destructive Testing Methods, Plate and Pipe Weld) | 4 වන මට්ටම | අවු 03 |
| 11. | **පොත් බඳින්නා - Book Binder** | | |
| | මුද්‍රණ කර්මාන්තය හඳුන්වා දීම, පොත් බැඳීම සහ අවසන් කිරීම, පොත් බැඳීමේ අවසාන කිරීමේ කොටස් හැඩගැස්වීම, මුද්‍රණයට සූදානම් වීම/හිස් කඩදාසි සුරක්ෂිත කිරීම, Finishing, කොළ සූදනම් කිරීම, එකතුකරගත් කොටස් සුරක්ෂිත කිරීම, පොත් කවරය සූදනම් කිරීම, Finishing කිරීම Spring back පොත් බැඳීම, Rebinding කිරීම | 4 වන මට්ටම | අවු 01 1/2 |

<table>
<tr><th></th><th>පාඨමාලා විස්තර</th><th>ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)</th><th>කාලය</th></tr>
<tr><td>12.</td><td>දැව කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ)- Carpenter (Furniture)<br>නවීන යන්ත්‍ර ආරක්ෂිතව පරිහරණය කොට දැව සහ සංයුක්ත දැව මගින් ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, අත් ආවුද සහ යන්ත්‍ර තල මුවහත් තැබීම හා නඩත්තුව, නවීන ආවුද සහ උපකරණ භාවිතයෙන් ගෘහ භාණ්ඩ නිමහුම් කිරීම, (පොලිෂ් කිරීම) දැව, තාක්ෂණය පිළිබඳ න්‍යායික දැනුම, කාර්මික ඇඳීම හා කාර්මික ගණිතය භාවිතයෙන් ඇස්තමේන්තු පිළියෙල කිරීම</td><td>4 වන මට්ටම</td><td>අවු .02</td></tr>
<tr><td>13.</td><td>දැව කාර්මික ශිල්පී (ගොඩනැගිලි) - Carpenter (Building)<br>වහල ඉදිකිරීම හා සිවිලිම නිර්මාණය මෙම විෂය කරුණුවලට අමතරව ගොඩනැගිලි නිර්මාණයේදී භාවිතා වන වෙනත් ශිල්පීය ක්‍රම න්‍යායිකාව හා ප්‍රායෝගිකව දැනුවත් කෙරේ.</td><td>4 වන මට්ටම</td><td>අවු 01 1/2</td></tr>
<tr><td>14.</td><td>ඇලුමිනියම් පිරිසැකසුම්කරු - Aluminium Fabricator<br>ඇළුමිනියම් ජනෙල් සහ දොරවල් සෑදීම, බෙදුම්කඩ (Partitions) කඩසාප්පු දොර සහ බිම්කඩ වෙන් කිරීම, ඉනිමං ඉදිකිරීම්, Glass and Tempered Glass සවිකිරීම, ප්‍රදර්ශන කබඩ් සෑදීම (Roller doors), නාන කාමර වෙන් කිරීම, (Shower cubicle) ඇතුළත දොර ඉදිකිරීම් සහ සවිකිරීම් (Roller doors) ඇළුමිනියම් සිවිලිම ඉදිකිරීම සහ සවිකිරීම වෙනත් ඇළුමිනියම් උපාංග සවිකිරීම</td><td>4 වන මට්ටම</td><td>අවු 01</td></tr>
<tr><td colspan="4">15 වෘත්තිය සඳහා අවම වශයෙන් 08 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබීම</td></tr>
<tr><td>15.</td><td>ජලනල කාර්මික ශිල්පී -Plumber<br>දැනට කර්මාන්ත ක්ෂේත්‍රයේ භාවිතා වන PVC, CPVC, GLPB, PB, PPR හා HDPF නල වර්ග But fusion, Heat Fusion හා Electro Fusion වැනි අති නවීන තාක්ෂණික ක්‍රමෝපාය භාවිතා කරමින් සම්බන්ධ කිරීම, නවීන සනීපාරක්ෂක උපාංග ස්ථාපනය, ජල පොම්ප ස්ථාපනය, උණුසුම් ජලනල පද්ධති ස්ථාපනය සහ සැලසුම් නිර්මාණය හඳුනාගැනීම් සහ ඇස්තමේන්තු සකස් කිරීම</td><td>4 වන මට්ටම</td><td>අවු 02</td></tr>
</table>

02. වයස .- 2022.04.22 වැනි දිනට වයස අවුරුදු 16 ට නොඅඩු 35 ට නොවැඩි විය යුතුය.

03. පුහුණුව පිළිබඳ විස්තර :

3.1 සියලුම පඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැලසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේදී මූලික පුහුණුව ආයතනය තුළ දී ලබාදේ. පුහුණුවේ දෙවන භාගයේදී වැඩිදුර පුහුණුව සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වල කාර්මාන්තශාලා වලට අනුයුක්ත කරනු ලැබේ. සියලුම වෘත්තීන් සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් බහුලව ඇත. සියලුම පාඨමාලාවන් සඳහා ඉංග්‍රීසි භාෂා දැනුම ලබා දෙනු ලැබේ.

04. තෝරා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

05. ප්‍රතිලාභ :

5.1 තෝරාගත් වෘත්තීන් සඳහා නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ රු. 4,000 ක මාසික දීමනාව
5.2 දුර අනුව නේවාසිකාගාර පහසුකම් (පිරිමි ළමුන්ට පමණයි)
5.3 සහන මිලට ශ්‍රීලංගම වාර ප්‍රවේශ පත්‍ර
5.4 පුස්තකාල පහසුකම්
5.5 සහන මිලට ආහාරපාන
5.6 නොමිලේ නිල ඇඳුම්

06. අයදුම්පත් එවිය යුතු ආකාරය :

6.1 පහත දක්වා ඇති ආකෘතියට අනුව 11 1/2" x 8 1 /2" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගත් හෝ www.naita.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් ඉල්ලුම්පත් ඔබගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සමඟ 2002.04.22 වැනි දිනට පෙර අධ්‍යක්ෂ/විදුහල්පති, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ ''ආධුනියකින් බඳවා ගැනීම - 2022 ජූලි'' යන්න සඳහන් කළ යුතු අතර, ඔබගේ ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් ඔබගේ ඉල්ලුම්පත සමඟ එවිය යුතුය.

6.2 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් ඉල්ලුම්පතේ සඳහන් කළ යුතුය.

6.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් දැනට හදාරන අයට මේ සඳහා අයදුම්කල නොහැක.

6.4 තැපැලේදී නැතිවන හෝ ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු අභ්‍යාස ආයතනය වගකියනු නොලැබේ. ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කළ යුතුය.

තරංග නලින් ගම්ලත්,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

**ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය**

කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - මොරටුව

**ආධුනිකයින් බඳවා ගැනීමේ අයදුම්පත - 2022 ජූලි**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනෙවිය.
02. මුලකුරු සමග නම :————.
03. ලිපිනය :————.
04. පදිංචිය i. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
ii. දිස්ත්‍රික්කය :————.
05. දුරකතන අංකය : නිවස :————. ජංගම :————.
06. උපන් දිනය :————.
07. ජාතික හැඳුනුම්පත් අංකය :————.
08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති ඉහලම අධ්‍යාපන සුදුසුකම x ලකුණින් සළකුණු කරන්න)

| අ.පො.ස. (උ. පෙළ) | | අ.පො.ස. (සා. පෙළ) | | 8 වන ශ්‍රේණිය | |
|---|---|---|---|---|---|

අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල

| | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

09. ඔබගේ සුදුසුකම් අනුව ඔබ විසින් හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් ප්‍රමුඛතාවය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| |
|---|
| 01. |
| 02 |
| 03. |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

03-137

**ජනමාධ්‍ය අමාත්‍යාංශය**

## රැකියා සුලභ මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටි මීඩියා ක්ෂේත්‍රයට පිවිසෙන්න

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO 9001:2015 නවතම තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි
ජනමාධ්‍ය අමාත්‍යාංශය
Sri Lanka Institute of Printing opens the door to a rewarding carrier in Printing, Graphics, Multi Media and packaging Industry

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2022**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටි මීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳවද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

කාලය : මාස 5 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුමද, පුහුණුවද ලබා දේ.

කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව ගාස්තුව රු. 22,000/- NVQ සහතිකපත් පාඨමාලා ගාස්තුව රු.31,000/-

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

කාලය : මාස 6 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨාමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව තුලින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

කාලය : මාස 08 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

**අරේඛීය සංස්කරණය - Non Liner Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හටද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප, නිර්මාණකරනය කිරීම හා එම රූප රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

කාලය : මාස 06(අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳ මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙදා පැනගින දෘඩාංග/මෘදුකාංග වලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැලි පුද්ගලයන්ටද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

කාලය : මාස 04(අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.19,000

**ඕෆ්සෙට් ලිතෝකරණය - Sheetfed Offset Printing**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුලත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගීවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණ කරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායි පුහුණුවකි.

පාඨමාලා කාලය : වසර 03යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : වසර 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,000

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙම විෂය මාලාව සකස් කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 1 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 50,000

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල් වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද, මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැළි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

කාලය : වසර 1 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,750

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන : 0112686162, 0112679791
, 0719716655
ෆැක්ස් : 011 2686162
ඊමේල් : sliopdir@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකථන : 0662222172, 071 0554298.

දුරකථන : 0112686162, 0112679791, 0719716655

ෆැක්ස් : 011 2686162 ඊමේල් : sliopreg@sltnet.lk වෙබ් අඩවිය : www.sliop.edu.lk

03-260

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.